අන්දරේ රජවාසල කවටයා.
රජවාසල ළඟම තිබුණු ගේ පොඩ්ඩක
අන්දරේ සතුටින් ජීවත් වුණා
තමාගෙ බිරිඳත් පුතාත් එක්ක.
බිරිඳ ලස්සනටත් පිරිසිදුවටත්
ගේ පොඩ්ඩ තියා ගත්තා.

මිදුලෙ කෙළවරම තිබුණෙ ළිඳ.

(c) Sumitha Publishers




(c) Sumitha Publishers

තම සැමියා රජවාසලේ සේවය කළ හින්දා
අන්දරේගෙ බිරිඳ තරමක් ආඩම්බරයි.
රජතුමාත් බිසවුන්නාන්සෙත්
අන්දරේට හරිම ආදරෙයි
ඔහු කරන කෙළි කවටකම් හින්දා.

ඒ වුණත් දවසක්දා රජවාසලට ගිය වෙලාවෙ
(c) Sumitha Publishers
බිසවුන්නාන්සෙගෙ කන ඇහෙන්නෙ නෑ කියලා
රවට්ටලා කෑ ගස්සපු හින්දා
බිරිඳ තරමක් අමනාපෙන් උන්නෙ.
එදා රජවාසලෙ හැම දෙනාම
බිරිඳට හිනා වුණා හින්දා
ඇගේ හිත රිදුණා ලැජ්ජාවෙ


(c) Sumitha Publishers